# සත්‍යක්‍රියාව

අපගේ අංගුලිමාල මහරහතන් වහන්සේ ඒ අපගේ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ළය මඬලින් උපන් මහා ක්ෂීණාස්‍රව රහතන් වහන්සේ නමක් බව ඒකාන්ත සත්‍යයි.

අපගේ අංගුලිමාල මහරහතන් වහන්සේ පංච අභිඥා අෂ්ට සමාපත්ති ආදී ලොව්තුරු ගුණයෙන් සුශෝභිතව වැඩ සිටි බව ඒකාන්ත සත්‍යයි.

අපගේ අංගුලිමාල මහරහතන් වහන්සේ ආර්ය ජාතියේ උපන් දා පටන් දැන දැන කිසිදු ප්‍රාණියෙකුට හිංසා පීඩා නොකළ බව සත්‍යයි.

අපගේ අංගුලිමාල මහරහතන් වහන්සේ රහත් බවට පත්වී නොසිටිය දී ම සැවැත් නුවර පිඬුසිඟා වැඩම කරන කල්හි එක්තරා වීදියක් අසබඩ දරුවෙකු බිහිකිරීමට නොහැකිව මහත් දුකෙන් පීඩිතව සිටි අසරණ මාතාවක් දුටු සේක. එකල්හී භාග්‍යවතුන් වහන්සේට එය සැළකොට භාග්‍යවතුන් වහන්සේගේ අනුදැනුම පිට එතැනට වැඩම කොට මෙසේ සත්‍යක්‍රියා කළ සේක. 'පින්වත් නැගණිය, ආර්ය ජාතියේ උපන් දා සිට මම දැන දැන සතෙක් මැරූ බවක් නොදනිමි. ඒ සත්‍යානුභාවයෙන් ඔබට සෙත් වේවා! ඔබේ දරුගැබට ද සෙත් වේවා!' යි සත්‍යක්‍රියා කළ සැණින් කිසිදු වේදනාවකින් තොරව ඒ මව දරුවා ද බිහිකොට මව හා දරුවා සුවපත් වූ බව ඒකාන්ත සත්‍යයි.

මේ සත්‍යානුභාවයෙන් ඔබ ද සුවපත් වේවා. ඔබේ කුස සිටිනා දරු සිඟිත්තා ද සුවපත් වේවා. නිදුක් වේවා. නීරෝග වේවා. සියලු යහපත සැලසේවා!